සැ. යු. - 2024.01.05 දින පළකරන ලද අංක 2366 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,367 - 2024 ජනවාරි මස 12 වැනි සිකුරාදා - 2024.01.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 14 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 පෙබරවාරි 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජනවාරි මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


13 - B 082531 — 353 (2024/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සියපත ෆිනෑන්ස් පීඑල්සී,
අංක 46/12,
සයුරු සෙවන, නවම් මාවත,
කොළඹ 02.

*පෙර දී,*
සියපත ෆිනෑන්ස් ලිමිටඩ් සහ සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරින් ලිමිටඩ් වශයෙන් හඳුන්වන ලදී.

*ලියාපදිංචි ලිපිනය :*

අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02.

*නඩු අංකය* : CHC/388/2019/MR
*කොළඹ වාණිජ මහාධිකරණ*
*ඇස්කිසි අංකය* : 20/2023

....................*පැමිණිලිකරු.*

*එදිරිව*

නට්තුණම් ඇන්ටනී සකරියාස්,
අංක 12,
ශාන්ත මේරි මාවත, මට්ටක්කුලිය,
කොළඹ 15.

......................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2021ක් වූ අගෝස්තු මස 06 වැනි දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, විත්තිකරුට එරෙහිව පැමිණිල්ලේ ආයාචනය පරිදි,

(*අ*) ඉහත ණය පහසුකම මත වර්ෂ 2018 සැප්තැම්බර් මස 29 වැනි දිනට රු. 34,984,335.11 ක මුදලක් සහ වර්ෂ 2018 සැප්තැම්බර් මස 30 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු මාසිකව 2%ක පොළිය පැමිණිලිකරුට අයකර දෙන ලෙසට විත්තිකරුට එරෙහිව තීන්දු කරන ලෙසත්,

(*ආ*) මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ එකී මුදල් ගෙවීම සඳහා බැඳී ඇති බවට හා ඒ සඳහා ඇස්කිසි ක්‍රියාත්මක කළ හැකි බවටත්,

(*ඇ*) තීන්දු ප්‍රකාශයේ සඳහන් දිනයේ සිට මාස දෙකක් ඇතුළත තීන්දු ප්‍රකාශිත මුදල පැමිණිලිකරුට ගෙවීමට විත්තිකරු පැහැර හැරියහොත් මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති දේපළ ගරු අධිකරණය විසින් පත් කරනු ලබන බලයලත් වෙන්දේසිකරුවෙකු මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටුකිරීමට විත්තිකරු විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක CHC/388/2019/MR දරන නඩුව යටතේ නිකුත් කර ඇති ඇස්කිසිය ප්‍රකාරව, කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2023ක් වූ ජුනි මස 28 වැනි දින නිසිලෙස තහනම් කරන ලද විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 09 වැනි දින පෙ. ව. 10.30ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති මට්ටක්කුලිය, විස්වයික් පාර, අංක 126 යන ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුළ සහ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මට්ටක්කුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මට්ටක්කුලිය විස්වයික් පාරේ, අංක 126හි පිහිටා තිබෙන ලොට් 4 නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. සිවසුන්දරම් විසින් මැන සාදන ලද 1975 අප්‍රේල් මස 10 වැනි දිනැති අංක 1235 දරන පිඹුරෙන් නිරූපිත ලොට් 4 දරන ඉඩමට මායිම්, වයඹට : විස්වයික් පාර ද, ඊසානට : මෙහි ලොට් 3 සහ සාන්ත මේරි මාවතේ අංක 10 සහ 10/2 දරන ගොඩනැගිල්ල ද, ගිණිකොණට : මෙහි ලොට් 5 ද, නිරිතට : විස්වයික් පාරේ පිහිටා තිබෙන අංක 124 දරන ගොඩනැගිල්ල ද, අංක 1235 දරන පිඹුර ප්‍රකාර පර්චස් එකොළහයි දශම හයයි අටක (පර්. 11.68) ඉඩමෙහි එහි ඇති ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියලු දේ සහ එකී ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 129/68හි ලියාපදිංචි කර ඇත.

මෑතක දී සිදු කරන ලද මැණීමට අනුව එකී ඉඩම පහත පරිදි වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුළ සහ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මට්ටක්කුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මට්ටක්කුලිය විස්වයික් පාරේ අංක 126 හි පිහිටා තිබෙන ලොට් 4 A නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්. කාර්වල්හෝ විසින් මැන සාදන ලද 2015 අගෝස්තු මස 31 වැනි දිනැති අංක 226/2015 දරන පිඹුරෙන් නිරූපිත ලොට් 4 A (ඉහත ඉඩම බලයලත් මිනින්දෝරු වී. සිවසුන්දරම් විසින් 1975 අප්‍රේල් මස 10 වැනි දිනැති අංක 1235 දරන පිඹුරේ ලොට් 4 දරන කොටස නැවත මැන සාදන ලදී.) දරන ඉඩමේ මායිම්, වයඹට : විස්වයික් පාර ද, ඊසානට : විස්වයික් පාරේ පිහිටා තිබෙන අංක 130 දරන ගොඩනැගිල්ල සහ පාර ද, ගිණිකොණට : ශාන්ත මේරි පාර සහ අංක 16 දරන ගොඩනැගිල්ල ද, නිරිතට : විස්වයික් පාර සහ අංක 124 දරන ගොඩනැගිල්ල හි පිහිටි අංක 226/2015 දරන ඉහත පිඹුර ප්‍රකාර පර්චස් එකොළහයි දශම හයයි අටක (පර්. 11.68) ප්‍රමාණයේ ඇති ගොඩනැගිල්ල ගහකොළ ඇතුලු සියලු දේ සහ එකී ඉඩම.

*දේපළට පිවිසීම.-* කොළඹ, කොච්චිකඩේ සිට අළුත් මාවත ඔස්සේ මට්ටක්කුලිය දෙසට යන විට මාර්ගයේ වම්පසට හමුවන ශාන්ත මේරි පාරට හැරී යන විට හමුවන T හංදියෙන් වම් පසට හැරී යන විට වම් පසට හමුවන දෙවන ගොඩනැගිල්ල වේ.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2024 ක් වූ ජනවාරි මස 02 වැනි දින,
කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය.

01-78

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.